www.agaram.lk

44443

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 06 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

නම/විභාග අංකය :- ................................................................ කාලය: පැය 02 යි.

**I කොටස**

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) සිදුහත් කුමරාගේ සන්දුත් අභියස වූ කිසාගෝතමිය විසින් කරන ලද ප්‍රකාශය හඳුන්වනු ලබන්නේ,
(1) තාරපිත ගාථා නමිනි. (2) නිබ්බුත පද නමිනි. (3) ජන්න මානවක ගාථා නමිනි.

(02) ලුම්බිණි සල් උයන ශාසන ඉතිහාසය තුළ වැදගත් වන්නේ,
(1) සුජාතාව කිරිපිඩු දානය පිළිගැන්වූ ස්ථානය නිසා ය.
(2) සිදුහත් කුමරු ශිල්ප දැක්වූ ස්ථානය නිසා ය.
(3) සිදුහත් කුමරු උපත ලැබූ ස්ථානය නිසා ය.

(03) සුද්ධෝදන රජතුමා විසින් සිදුහත් කුමරුට පළමු වරට වැඳිනු ලැබුවේ,
(1) අසිත තවුසා මාලිගයට පැමිණි දිනයේ ය.
(2) වප්මඟුල් දිනයේ ය.
(3) නම් තැබූ දිනයේ ය.

(04) සිදුහත් බෝසත්තුමාට කුස තණ මිටි අටක් පිළිගන්වනු ලැබුවේ,
(1) කොණ්ඩඤ්ඤ බමුණා විසින් ය.
(2) සොත්ථිය බමුණා විසින් ය.
(3) ආලාරකාලාම තවුසා විසින් ය.

(05) විහාරස්ථානයට ගොස් ත්‍රිවිධ චෛත්‍ය වැඳුම් පිදුම් කිරීමේ අනුපිළිවෙල වන්නේ,
(1) වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ, ප්‍රතිමා වහන්සේ
(2) ප්‍රතිමා වහන්සේ, බෝධීන් වහන්සේ, වෙහෙර වහන්සේ
(3) වෙහෙර වහන්සේ, ප්‍රතිමා වහන්සේ, බෝධීන් වහන්සේ

(06) ශික්ෂාකාමී භික්ෂූන් අතර අගතනතුර ලැබුවේ,
(1) ආනන්ද හාමුදුරුවෝ ය. (2) අස්සජි හාමුදුරුවෝ ය. (3) රාහුල හාමුදුරුවෝ ය.

(07) දියුණුවේ දොරටු පිළිබඳව මඟ පෙන්වන ජාතක කතාවක් වන්නේ,
(1) මිත ජාතකයයි. (2) අත්ථස්සද්වාර ජාතකයයි. (3) සංඛ ජාතකයයි.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(08) පිළිවෙත් කටයුතු කිරීමෙන් ලැබෙන ආනිසංස පහක් බුද්ධාගමේ සඳහන්වේ. එයට අයත් නොවන්නේ,
(1) කීර්තිය පැතිරීම ය.
(2) මහත් වූ භෝග සම්පත් ලැබීම ය.
(3) මරණයට බිය වීම ය.

(09) සීල සික්ඛාවට අයත් මාර්ග අංග වන්නේ,
(1) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව
(2) සම්මා ආජීව, සම්මා සති, සම්මා සමාධි
(3) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා සති

(10) සියලු ජාතීන් අතර එකමුතු බව ද එකිනෙකා අතර අවබෝධය ද නිරූපණය වන සංකේතයක් කිරීමට ජාතික කොඩියෙහි ඇතුළත් වන්නේ,
(1) සහ තීරුවයි. (2) අසිපතයි. (3) බෝපත් හතරයි.

(11) සතර බ්‍රහ්ම විහරණ පද,
(1) දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාවය
(2) මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා
(3) ජාති, ජරා, ව්‍යාධි, මරණ

(12) කළගුණ සැලකීමේ අගය ලෝකයාට පෙන්නුම් කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ යොදාගත්තේ,
(1) සත් සති ගත කිරීමේ පළමු සතියේ ය.
(2) සත් සති ගත කිරීමේ දෙවන සතියේ ය.
(3) සත් සති ගත කිරීමේ හත්වන සතියේ ය.

(13) මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවේ දී දේශනා කළ මුල්ම සූත්‍ර දේශනාව වන්නේ,
(1) මහා මංගල සූත්‍රයයි.
(2) දම්සක් පැවතුම් සූත්‍රයයි.
(3) චූලහත්ථිපදෝපම සූත්‍රයයි.

(14) අනුරාධපුර ථූපාරාම චෛත්‍යයෙහි තැන්පත්කර ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ,
(1) දකුණු අකු ධාතුවයි. (2) ලලාට ධාතුවයි. (3) වම් අකු ධාතුවයි.

(15) උඳුවප් පුර පසළොස්වක පොහොය දිනය ලක්වැසියන්ට වැදගත් වන්නේ,
(1) මිහිඳු මහරහතන් වහන්සේ වැඩම කළ නිසා ය.
(2) ලංකාවේ භික්ෂු ශාසනය ආරම්භ කළ නිසා ය.
(3) ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කළ නිසා ය.

(16) ලෝක පරිසර දිනය යෙදී ඇත්තේ සෑම වසරකම
(1) මැයි මස 05 වැනිදා ය. (2) ජූනි මස 05 වැනිදා ය. (3) ජූලි මස 04 වැනිදා ය.

(17) ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය ලෙස පිළිගැනු ලබන්නේ,
(1) රතු නෙළුම් මලයි. (2) මලු මලයි. (3) නිල් මානෙල් මලයි.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(18) පාඩම් කිරීමට, රැකියාවට, භාවනා කිරීමට කම්මැලිකම බාධාවකි. කම්මැලි නොවී කටයුතු කිරීම දහමෙහි හඳුන්වා ඇත්තේ

(1) අලීනතා නමිනි. (2) ධම්මානුවත්ති නමිනි. (3) අප්පිච්ඡතා නමිනි.

(19) බුදුරජාණන් වහන්සේ සම්පත් ආරක්ෂා කරගැනීම සඳහා උපදෙස් හතරක් දේශනා කර ඇත්තේ,

(1) කාලාම සූත්‍රයේ ය. (2) කුල සූත්‍රයේ ය. (3) පරාභව සූත්‍රයේ ය.

(20) බුද්ධිමත්ව අවබෝධයෙන් යුක්තව තෙරුවන් කෙරෙහි ඇතිවන පැහැදීම හඳුන්වනු ලබන්නේ,

(1) ආකාරවතී ශ්‍රද්ධාව නමිනි. (2) අමූලිකා ශ්‍රද්ධාව නමිනි. (3) ආගමික ශ්‍රද්ධාව නමිනි.

(2 × 20 = 40)

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

පළමුවන ප්‍රශ්නයේ එක් කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 20ක් ද, 02 සිට 06 දක්වා ප්‍රශ්නවල I කොටසට ලකුණු 02ක් ද II කොටසට ලකුණු 03ක් ද III කොටසට ලකුණු 05ක් ද හිමිවේ. 07 ප්‍රශ්නයේ එක් කොටසකට ලකුණු 05කි.

(01) බුදුරජාණන් වහන්සේ පරිසර හිතකාමී ශාස්තෘවරයෙකි. උන්වහන්සේ තම ශ්‍රාවකයන්ට පරිසර සුරක්ෂිතතාවයෙහි ඇති වැදගත්කම පිළිබඳ පැහැදිලිකර ඇත. ඔබ ඉගෙනගත් කරුණු ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) පරිසරය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ii) පරිසරයෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(iii) පරිසරය දූෂණය වන ක්‍රම දෙකක් ලියන්න.

(iv) පරිසර දූෂණය නිසා ඇති වන ගැටළු දෙකක් සඳහන් කරන්න.

(v) බුද්ධ චරිතය පරිසරය හා සම්බන්ධ වූ අවස්ථා දෙකක් නම් කරන්න.

(02) (i) සිදුහත් බෝසතාණන් වහන්සේ උපන් අවස්ථාවේ සිදුවූ විශේෂ සිදුවීම් දෙකක් ලියන්න.

(ii) අග්ගෝහමස්මි ලෝකස්ස... යන ගාථාව නිවැරදිව ලියන්න.

(iii) සිදුහත් බෝසත් චරිතයෙන් පාසල් සිසුන්ට ලබාගත හැකි ආදර්ශයන් මොනවාදැයි දක්වන්න.

(03) (i) පංචශීලයෙහි සඳහන් පළමු හා හතරවන ශික්ෂාපද ලියන්න.

(ii) යහපත් වචනය සතර ආකාර වේ. ඉන් තුනක් නම් කරන්න.

(iii) පිළිවෙත් කටයුතු කිරීමෙන් සිසු ජීවිතය සාර්ථක කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(04) (i) අන්‍යූපනායික ධර්ම පර්යාය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ii) ශ්‍රාමණේර පාරිශුද්ධි ශීලයට අයත් අංග තුන ලියන්න.

(iii) "සියල්ලොව දඬුවමින් තැතිගනිති සියල්ලොව ජීවිතයට ප්‍රිය වෙති." යන අදහස දෙන ධම්මපද ගාථාව ලියන්න.

(05) (i) මහින්දාගමනයෙන් පසු බුදු සසුනේ පැවිදි ලැබූ මුල්ම ශ්‍රී ලාංකිකයා කවු ද?

(ii) මිහිඳු මහරහතන් වහන්සේ සමග ලක්දිවට වැඩම කළ ධර්මදූත පිරිස නම් කරන්න.

(iii) මහින්දාගමනයෙන් පසුව ශ්‍රී ලාංකිකයන්ට ලැබුණු දායාද පහක් ලියන්න.

(06) (i) දෙමව්පියන් හා දූ දරුවන්ගේ යුතුකම් පිළිබඳව සඳහන් වන බෞද්ධ සූත්‍රයේ නම ලියන්න.

(ii) දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න.

(iii) මවට වඳින ගාථාව නිවැරදිව ලියන්න.

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) ජාතක වස්තුව

(ii) මෙත් වැඩීම

(iii) රාහුල පොඩි හාමුදුරුවෝ

(iv) දුමින්දාගමනය



Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

agaram.lk

www.agaram.lk

029

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

### 6 - ශ්‍රේණිය
### ඉස්ලාම් ධර්මය

නම/විභාග අංකය :- ......................................................................... කාලය: පැය 02යි.

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ඉතා සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) නබිවරුන්ට වහි ගෙන එන මලක්වරයා

(1) ඉස්රාෆීල් (අලෛ) (2) රකීබ් (අලෛ)
(3) ජිබ්රීල් (අලෛ) (4) රිල්වාන් ( අලෛ)

(02) මලක්වරුන් මවන ලද අමු ද්‍රව්‍යය

(1) පස (2) ගින්දර (3) ආලෝකය (4) සුළඟ

(03) 'ඉස්ලාම්' යන අරාබි පදයෙහි අරුත් අතරින් එකකි,

(1) යටහත්වීම (2) පාරිශුද්ධිය (3) ප්‍රාර්ථනාව (4) උත්සාහය

(04) 'මාඋන් තාහිර්' වලට උදාහරණයකි,

(1) ගංවතුර (2) බීම වර්ග (3) වැසි ජලය (4) කාණු වතුර

(05) මුස්ලිම්වරයාව කුෆ්රයෙන් වෙන් කර දක්වන ඉබාදතය

(1) සවුම් (2) හජ් (3) සලාත් (4) දික්ර්

(06) උපවාසයේ ෆර්ලුයන්

(1) හතරකි. (2) දෙකකි. (3) තුනකි. (4) පහකි.

(07) නබි (සල්) තුමා අහස් තලයට ගිය ගමන

(1) හිජ්රත් (2) ඉස්රා (3) මිහ්රාජ් (4) රවිදා

(08) අන් අයගේ නිවසට පිවිසීමට පෙර අවසරගත යුතු වාර ගණන

(1) දෙකයි. (2) තුනයි. (3) හතරයි. (4) පහයි.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(09) (අල් කුර්ආනය) වහී ලිවීමට පත්කරන ලද්දන්

(1) කිරාමුන් කාතිබූන් (2) ජාමිඋල් කුර්ආන්

(3) කිරාඅතුල් කුර්ආන් (4) කුත්තාබුල් වහී

(10) සූරා ඉඛ්ලාස්හි තවත් නමකි.

(1) තව්හීද් (2) සබ්උල් මසානි

(3) කුර්රත් මුහර්රිලීන් (4) මත්සිලුල් කුර්ආන්

(11) ඉස්ලාමීය ප්‍රධාන මූලාශ්‍රයන්

(1) තුනකි. (2) සතරකි. (3) දෙකකි. (4) පහකි.

(12) මුහම්මද් (සල්) තුමාගේ පියාගේ නම

(1) අබූ තාලිබ් (2) අබ්දුල්ලාහ්

(3) අබ්දුල් මනාෆ් (4) අබ්දුල් මුත්තලිබ්

(13) සල්මානුල් ෆාරිස් (රලි) තුමා මෙම රටට අයත්වූවෙකි.

(1) සිරියා (2) යෙමනය (3) ඇබිසීනියා (4) පර්සියාව

(14) මුහම්මද් (සල්) තුමා හට නුබුව්වත් ලැබී වසර 13කින් සිදු වූ සිදුවීම

(1) හිජ්රත් (2) මිහ්රාජ් (3) ඉස්රා (4) රිසාලත්

(15) 'ලානත්' යන අරාබි පදයෙහි තේරුම

(1) ආදරය (2) අපේක්ෂාව (3) කෝපය (4) ශාපය

(16) නබිවරුන්ගේ වරාසත් වත්කම

(1) දැනුම (2) රත්‍රන් (3) රිදී (4) මුදල්

(17) වුළූහි ෆර්ළ් අතරින් එකකි.

(1) දත් මැදීම (2) කට සේදීම (3) දූආ ඉසිරීම (4) හිස මස්හු කිරීම

(18) ධනය පිරිසිදු කරන වගකීම

(1) සලාත් (2) සවුම් (3) හජ් (4) සකාත්

(19) ආදම් (අලෛ) තුමා වෆාත් වූ දිනය

(1) සිකුරාදා (2) සෙනසුරාදා (3) බදාදා (4) සඳුදා

(20) අහම්බු ලෙස සිදුවන අනතුරක දී ප්‍රථමයෙන් උදව්වන අය වන්නේ,

(1) අසල්වැසියන් (2) මිතුරන් (3) දොසින් (4) මුස්ලිම්වරු

(2 x 20 = 40)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

## II කොටස

- 'අ' , 'ආ' කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් බැගින් තෝරා, පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු '16' බැගින් ද, අනෙකුත් සෑම එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු '11' බැගින් ද හිමිවේ.

(01) පාසල් පාදක ඇගයීම් ක්‍රියාවලියෙහි "අල්ලාහ්ගේ මැවීම්" යන තේමාව යටතේ ඔබ ඉටුකළ පැවරුම පදනම් කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) අල්ලාහ්ගේ මැවීම් අතරින් පෘථිවියෙන් එහා පිහිටි අති විශාල මැවීම් දෙකක් නම් කරන්න.

(2) ජිබ්රීල් (අලෛ) හැඳින්වෙන සුවිශේෂ නම් තුනක් සඳහන් කරන්න.

(3) මිනිසා හා මලක්වරු අතර පවතින වෙනස්කම් තුනක් වගුගත කර දක්වන්න.

(4) ප්‍රධාන මලක්වරු දසදෙනා නම් කරන්න.

(5) ජින්වරු මවන ලද්දේ කුමකින් ද?

(6) ශෛතාන්වරු යනු කවරෙකු ද? (2+3+3+5+1+2 = 16)

(02) (1) 'තව්හීද්' , 'රිසාලත්' යන අරාබි පදයන්හි අරුත් ලියන්න.

(2) පළවෙනි සූර්, දෙවෙනි සූර් නාලාව පිඹින ලද විගස සිදුවන දෑ විස්තර කරන්න.

(3) ඊමාන් දැරිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න.

(4) මාලත් තර්ජ්වලට උදාහරණ තුනක් සඳහන් කරන්න. (2+3+3+3 = 11)

(03) (1) අනිවාර්ය වූ සවුමය රකින මාසය නම් කරන්න.

(2) හජ්ජ් හි කොටස් තුන සඳහන් කරන්න.

(3) උපවාසය මඟින් වර්ධනය වන යහගුණ තුනක් සඳහන් කරන්න.

(4) වුළුහි ෆර්ල් තුනක් ලියන්න. (2+3+3+3 = 11)

(04) (1) පිළිගනු ලැබූ හජ් සඳහා අල්ලාහ් විසින් දෙනු ලබන තිළිණය කුමක් ද?

(2) දිවෙන් සිදුවන පාප කර්ම තුනක් ලියා දක්වන්න.

(3) දෙමව්පියන් සඳහා ඉටුකළ යුතු යුතුකම් තුනක් ලියන්න.

(4) රමලානයේ තිබෙන විශේෂ රාත්‍රිය නම් කර, එහි වැදගත්කම ද ලියන්න. (2+3+3+3 = 11)

(05) (1) 'රළියල්ලාහු අන්හු' යන අරාබි පදයෙහි අරුත ලියන්න.

(2) සෙයිද් බින් සාබිත් (රළි) ගේ සේවාවන් දෙකක් ලියන්න.

(3) 'අහ්ලුල් බයිත්' වරුන්ගෙන් 3 දෙනෙක් නම් කරන්න.

(4) සිත පිරිසිදු කරන සත්ක්‍රියාවන් තුනක් සඳහන් කරන්න. (2+3+3+3 = 11)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(06) (1) අල්-කුර්ආනය සඳහා වූ වෙනත් නම් දෙකක් සඳහන් කරන්න.

(2) අසල්වාසින් හට කළ යුතු යුතුකම් තුනක් සඳහන් කරන්න.

(3) පරිසරය දූෂණය කරන කරුණු තුනක් සඳහන් කරන්න.

(4) සලාතය මගින් අත්වන යහඵල තුනක් සඳහන් කරන්න. (2+3+3+3 = 11)

(07) (1) ආදම් (අලෛ) තුමාගේ ගරු නාමය කුමක් ද?

(2) ආයිෂා (රලි) තුමියට හිමි වූ ගරු නාමයන් දෙකක් සඳහන් කරන්න.

(3) ජාහිලියියා යුගයේ පැවතුනු දුෂ්ක්‍රියා තුනක් සඳහන් කරන්න.

(4) සලාත්හි ෂර්තයන් සතරක් සඳහන් කරන්න. (2+2+3+4 = 11)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk